# චතාරික සමයේ දෙවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

ජෙරමියා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෙරමියා 18 : 18 – 20

**එන්න, අපි ජෙරමියාට විරුද්ධව උපා යොදමු.**

සමිඳාණන් වදාළ වචන ජෙරමියා සෙනඟට කී කල සෙනඟ පිළිතුරු දෙමින් "එන්න, අපි ජෙරමියාට විරුද්ධව උපා යොදමු. අපට අනුශාසනා කිරීමට පූජකයන් ද උපදෙස් දීමට ප්‍රඥාවන්තයන් ද පණිවුඩ ප්‍රකාශ කිරීමට දිවැසිවරුන් ද නිතරම සිටිනු ඇත. ඒ නිසා ජෙරමියා කියන දෙයට සවන් නොදී ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරමු" යි කීහ. එවිට ජෙරමියා සමිඳාණන් වහන්සේට මෙසේ යාච්ඤා කළේය. සමිඳුනි, මාගේ සතුරන්ට විරුද්ධව කියන දෙයට සවන් දෙන්න. මාගේ පැමිණිල්ල අසන්න. යහපතට පල විපාකය අයහපත ද? මාගේ සතුරන් මා නසන්ට බොරු වළක් හාරා ඇත. ඔවුන් වෙනුවෙන් ඔබේ කෝපය පහ කරන පිණිස ඔවුන්ගේ යහපත උදෙසා කතා කරන්නට මා ඔබ ඉදිරියෙහි සිටි බව සිහි කළ මැනව.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **31 : 4-5, 13-15**

පිළිතුර: සමිඳුනි, ඔබේ තිර පෙමින් මා ගැළෙව්ව මැනව.

ගීය:

මා ඇල්ලීමට ඔවුන් සඟවා ඇති දැලෙන් මා බේරාගත මැනව.
ඔබ මාගේ රක්ෂාස්ථානය ය. ඔබ අතට මාගේ ජීවිතය බාර කරමි.
සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.

බොහෝ දෙනෙකුගේ කෙළෙසුම් බස් මට ඇසේ. මා අවට භීතිය ඇත. මිනිස්සු මට විරුද්ධව කුමන්ත්‍රණය කොට, මාගේ දිවි නසාලීමට උපා යොදති.

එහෙත් සමිඳුනි, මා විශ්වාසය තැබුවේ ඔබ කෙරෙහි ම ය. "මාගේ දෙවියෝ ඔබ ය" යි කියමි.
මාගේ ජීවිත ගමන ඔබ අතෙහි ය. මාගේ සතුරන් හා මට පීඩා කරන්නවුන් අතින් මා මුදා හැරිය මැනව.

## සාධුකාරය

"දෙවියන් වහන්සේ ලෝකයට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන්නා හ."

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 20 : 17 – 28

***එතුමාණෝ මරණයට නියම කරනු ලබන්නාහ.***

ජේසුස් වහන්සේ ජෙරුසලමට යමින් සිටි සේක. අතරමග දී ශ්‍රාවකයන් දොලොස් දෙනා වෙන් කොට ගෙන ඔවුන්ට කතා කොට, "දැන් අපි ජෙරුසලමට යමුහ. මනුෂ්‍ය පුත්‍රයාණෝ නායක පූජකයන්ටත් විනයධරයන්ටත් පාවා දෙනු ලබන සේක. ඔව්හු එතුමාණන් මරණයට නියම කොට කවටකම් කිරීම ද තැළීම ද කුරුසියෙහි ඇණගැසීම ද සඳහා විජාතීන්ට පාවා දෙති. එහෙත් තුන්වනදා එතුමාණෝ උත්ථාන කරනු ලබන සේකැ"යි වදාළ සේක.

එකල සෙබදීගේ පුත්‍රයන්ගේ මව ඇගේ පුත්‍රයන් හා සමග උන් වහන්සේ වෙත අවුත්, දණින් වැටී එක් වරයක් ඉල්ලුවා ය. උන්වහන්සේ කතා කරමින් "ඔබ කුමක් ඉල්ලන්නෙහිදැ" යි ඇයගෙන් ඇසූ සේක. ඈ පිළිතුරු දෙමින් "ඔබගේ රාජ්‍යයෙහි දී මේ මාගේ පුතුන් දෙදෙනාගෙන් එක් කෙනෙකු ඔබගේ දකුණු පසෙහි ද, එක්කෙනෙකු වම් පසෙහි ද හිඳ ගැනීමට නියම කළ මැනැවැ" යි කීවාය. එහෙත් ජේසුස් වහන්සේ උත්තර දෙමින් "ඔබ ඉල්ලන්නේ කුමක් දැ යි ඔබම දන්නේ නැත. මා බොන්න යන දුක් වේදනා නමැති කුසලානෙන් බොන්න ඔබට හැකි දැ" යි ඇසූ සේක. "අපට හැකියැ"යි ඔව්හු පිළිතුරු දුන්හ. උන් වහන්සේ ඔවුන්ට කතා

කොට "සැබැවින්ම ඔබ මාගේ කුසලානෙන් බොන්නහු ය. එහෙත් මාගේ දකුණු පසෙහි ද වම් පසෙහි ද හිඳගන්න දීම මා සතු දෙයක් නොවේ. මාගේ පියාණන් වහන්සේ විසින් ඒවා යම් අය සඳහා නියම කරන ලද්දේ ද ඒවා අයිති ඔවුන්ට ය" යි වදාළ සේක. දස දෙනා එපවත් ඇසූ විට ඒ සොහොයුරන් දෙදෙනා ගැන කෝප වූහ.

එහෙත් ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා මෙසේ වදාළ සේක. "විජාතීන්ගේ ආණ්ඩුකාරයන් ඔවුන් කෙරේ බලය පවත්වන බවත් ඔබ දන්නහු ය. එහෙත් ඔබ අතරේ එසේ නොවිය යුතු යි. ඔහු ඔබේ සේවකයා වන්නේය. ඔබ අතරේ යමෙක් ප්‍රධානියා වන්නට කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේය. මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලබන්නට නොව, සේවය කරන්නටත්, බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා සිය දිවි පිදීමටත් ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.